# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2069/16 - 2018 මැයි මස 01 වැනි අඟහරුවාදා - 2018.05.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 21/78(xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍ය කබීර් හෂීම් වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර, එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලබන, ශ්‍රී ලංකාවේ කැලණිය විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, 2006 ජූලි මස 22 වැනි දින අංක 1454/37 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද (2017 ජුනි මස 14 වැනි දින අංක 2023/33 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) නියමයේ උපලේඛනයේ I වන තීරයේ දක්වෙන ''මානව ශාස්ත්‍ර පීඨය '' යන අයිතමයට අනුරූපය එම උපලේඛනයේ II වන තීරයේ දක්වෙන ''සංස්කෘතික අධ්‍යයන අංශය '' යන සටහන වෙනුවට පහත දක්වෙන සටහන ආදේශ කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

''6. සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයන අංශය''.

කබීර් හෂීම්,
උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍ය.

2018 අප්‍රේල් මස 20 වැනි දින,
කොළඹ දී ය.

05 -446

1A - PG 4023 — 508 (2018/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*